www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදය "බැරෑරුම් සාකච්ඡා" පිලිබඳ ඉරානයේ කැමැත්ත ප්‍රතික්ෂේප කරයි

## US administration rejects Iran's offer of "serious negotiations"

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2006 අගෝස්තු 24**

දඬුවම් ආර්ථික සම්බාධක පැමිනවීම සහ ටෙහෙරානය සමග ගැටුම තියුනු වීමක් සඳහා වේදිකාව සකසමින්, බුෂ් පරිපාලනය "බැරෑරුම් සාකච්ඡා" පිලිබඳ ඉරානය කල යෝජනාව තමන් ප්‍රතික්ෂේප කරන බවට ඊයේ සංඥාවක් කලේ ය.

එක්සත් ජනපදයේ මෙම ප්‍රතිචාර දැක්වීම සිදුවූයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ස්ථිර සාමාජිකයින් පස් දෙනකු සහ ජර්මනිය විසින් ඉරානයේ න්‍යෂ්ටික වැඩපිලිවෙල සම්බන්ධව ඉදිරිපත් කල යෝජනා මාලාවකට ටෙහෙරානය දීර්ඝ පිලිතුරක් සැපයීමෙන් යන්තම් දිනකට පසුවය.
ඉරානයේ ප්‍රතිචාරය "ආරක්ෂක මන්ඩලය විසින් ඉදිරිපත් කල කොන්දේසිවලට වඩා අඩුවක් පෙන්නුම් කරන" බව ධවල මන්දිර ප්‍රකාශිකා ඩැන් පෙරිනෝ බදාදා නිවේදනය කලාය.

එහි යුරේනියම් බලගැන්වීමේ ව්‍යාපෘතීන් නතර කිරීමේ සහ සියලු ම න්‍යෂ්ටික පහසුකම් සම්බන්ධව අවසරයකින් තොරව පරීක්ෂා කිරීමට එකඟවීම සඳහා ඉරානයට දෙන අවසන් දිනය ලෙස අගෝස්තු මාසයේ අවසානය නම් කරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා ජූලි 31 එක්සත් ජනපදය යෝජනාවක් ඉදිරිපත් කලේ ය. න්‍යෂ්ටික වැඩපිලිවෙල නතර කිරීමට අසමත් වුවහොත් ඉරානය මත සම්බාධක පැනවීමේ අලුත් යෝජනාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉක්මනින් ම ඉදිරිපත් කිරීම එක්සත් ජනපදය සූදානම් කරන බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වොෂින්ටන් තානාපති ඉරානයේ ලියවිල්ල කියවීමට පෙර අඟහරුවාදා ප්‍රකාශ කලේ ය.

ඉරානය සමග සාකච්ඡා කිරීමේ සුලු උනන්දුවක් වත් බුෂ් පාලන තන්ත්‍රය පෙන්නුම් කර නැත. බුෂ් සහ ඔහුගේ නිලධාරීන් ගැටුමට "රාජ්‍යතාන්ත්‍රික විසඳුමක්" ගැන කථාකරන විට අවශ්‍යයෙන්ම ඉරානය සමග සාකච්ඡා කරන බවක් ඉන් අදහස් නොකෙරෙයි. ඒ වෙනුවට එක්සත් ජනපදයේ පිලිවෙත වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මන්ඩලයේ සෙසු සාමාජිකයන් ඉරානයට විරුද්ධව අවසන් නිවේදන නිකුත් කිරීමට සහ සම්බාධක පැනවීමට එකඟ කරවා ගැනීම සඳහා බලහත්කාරය පෑමකි. න්‍යෂ්ටික වැඩපිලිවෙල නතර කිරීමට ඉරානය පොලඹවාගැනීම සඳහා එක්සත් ජනපදයේ අනුමැතිය ඇතිව වෙන්කල ආර්ථික දිරිදීමනා පැකේජය "ඕනනම් ගනින් එපානම් නිකන් හිටපන්" පදනමක තබා ඇත.

අටුවාකරුවන් ගනනාවක් සඳහන් කල පරිදි, ඉරානයේ ප්‍රධාන ඉල්ලීමක් වූ යුරේනියම් බලගැන්වීම නතර කිරීම වෙනුවෙන් ආරක්ෂාව පිලිබඳ එක්සත් ජනපදයේ සහතික වීමක් ඇතුලත් කිරීම ප්‍රතික්ෂේප කල වොෂින්ටනය කිසිසේත් ම ඒකාබද්ධ පැකේජයට බැරෑරුම්ව සහයෝගය දුන්නේ නැත. "එක්සත් ජනපදයට ඉරානයට දීමට ඇත්තේ ප්‍රතික්ෂේප කිරීම පමනි" යන මාතෘකාව යටතේ *ඒෂියා ටයිම්ස් වෙබ් අඩවියේ* අගෝස්තු 24 පලවූ ලිපියක මෙසේ සඳහන් විය: "එක්සත් ජනපදය එවැනි (ආරක්ෂාව පිලිබඳ) සහතික දීමට මොනම සූදානමක්වත් තිබුනේ නැත. ඒ අනුව ඉරානය සමග සාකච්ඡා සඳහා අව්‍යාජ බහුපාර්ශවීය ආරම්භකත්වයක් ලෙස මතුපිටින් පෙනෙන්නට තිබුන දේ අවසන් විය.... එය අසාර්ථක වනු ඇතැයි බුෂ් පාලන තන්ත්‍රය ආරම්භයේ සිට ම තීරනය කර තිබුනු බව ජාත්‍යන්තර යෝජනාවල ඉතිහාසය පෙන්නුම් කරයි...."

පිටු 21 ඉරාන ලියවිල්ලේ විස්තර තවමත් ප්‍රසිද්ධ කර නැති නමුදු ටෙහෙරානයේ ප්‍රවිෂ්ටය ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික කොන්දේසි සමග බොහෝසෙයින් ම ගැලපෙයි. පසු ගිය සතියේ විදේශ ඇමති මනෝචර් මොටාකි යෝජනා කල පරිදි එහි යුරේනියම් බලගැන්වීමේ වැඩපිලිවෙල අත්හිටුවීම ගැන සාකච්ඡා කිරීමට ඉරානය කැමති බව පෙනෙන්නට තිබුනි. නමුත් කේවල්කිරීමේ නිමිත්ත ලෙස එය සලකන දෙය සාකච්ඡාවලට කලින් අතහැරීමට ඉරානය අකමැතිය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනාව සමග

මුලුමනින් ම එකඟතාව ප්‍රකාශ කිරීම හැර වෙනත් දෙයක් පිලිගත නොහැකි යැයි අවධාරනය කරමින් එක්සත් ජනපද නිලධාරීන් මොටාකිගේ ප්‍රකාශයන් හුදෙක් ම ප්‍රතික්ෂේප කලේ ය.

යුරේනියම් බලගැන්වීමේ ව්‍යාපෘතීන් න්‍යෂ්ටික අවි සඳහා නොව, න්‍යෂ්ටික බලය සඳහා යොමු කෙරුන ඒවා බව ඉරානය යලි යලිත් ප්‍රකාශ කර තිබේ. න්‍යෂ්ටික අවි සීමාකිරීමේ ගිවිසුම යටතේ, සාමාන්‍ය අරමුනු සඳහා යුරේනියම් බලගැන්වීම ඇතුලුව න්‍යෂ්ටික චක්‍රයේ සියලු අංශ පිලිබඳව පර්යේෂන කිරීමට සහ සංවර්ධනය කිරීමට තමන්ට අයිතියක් ඇතැයි ප්‍රකාශ කල ඉරානය පසු ගිය මාසයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්මත කල යෝජනාව "නීති විරෝධී" එකක් ලෙස නම් කලේ ය. අන්තර්ජාතික පරමානු බලශක්ති ආයතනය (අයිඒඊඒ) විසින් කරනු ලබන අතිශය ආක්‍රමනශීලී නිරීක්ෂන සඳහා ඉඩ සලසන ඊනියා අතිරේක නීතිවලට පමනක් නොව අවි අරමුනු සඳහා එහි න්‍යෂ්ටික ව්‍යාපෘතීන් යොදා නොගන්නා බවට සහතික වීමේ අතිරේක ආරක්ෂක ක්‍රම ගැන සාකච්ඡා කිරීමට ද ටෙහෙරානය මුලදී එකඟ විය.

ඉරාන පාලන තන්ත්‍රයේ සමහර කොටස්වලට න්‍යෂ්ටික බලයක් බවට පත්වීමේ අභිලාෂයන් ඇති බව ප්‍රතික්ෂේප කල නො හැකි නමුදු එබඳු ව්‍යාපෘතින් ඇති බවට කරන ප්‍රකාශ සනාථ කරන කිසිදු සාක්ෂ්‍යයක් බුෂ් පරිපාලනය ඉදිරිපත් කර නැත. ඉරානය පරමානුක අවියක් නිපදවමින් සිටින බවට කිසිවක් ඔප්පු කිරීමට අයිඒඊඒ ආයතනයේ වසර තුනක පරීක්ෂනය අසමත් වී ඇත. බුෂර් වරායේ බලශක්ති ප්‍රතික්‍රියාකාරකය සම්පූර්න කිරීම ඇතුලුව, ඉරානයේ සෑම න්‍යෂ්ටික ව්‍යාපෘතියක් ම වැලැක්වීමට දශක දෙකක් පුරා වොෂින්ටනය විසින් උත්සාහ කර ඇති බව ඉරානය මුලදී සියලු ම න්‍යෂ්ටික පහසුකම් ප්‍රකාශ කර නැතැයි යනුවෙන් එක්සත් ජනපදය කරන ප්‍රකාශවල දී නොතකා හැර තිබේ.

ඉරානයේ න්‍යෂ්ටික ක්‍රියාකාරිත්වයන්ට විරුද්ධව බුෂ් පරිපාලනයේ දෘඩතර ආස්ථානය, සම්පත් බහුල මැද පෙරදිග සහ මධ්‍යම ආසියානු කලාපවල එක්සත් ජනපද ආධිපත්‍යය සඳහා වන එහි අභිලාෂයන්හි කොටසක් ලෙස ටොහරානය තුල "පාලන තන්ත්‍ර වෙනසක්" කිරීම පිලිබඳ වඩාත් පුලුල් ඉලක්කයක නිමිත්තක් පමනකි. ඉරානයට සහ සිරියාවට එරෙහිව පුලුල් යුද්ධයක් සඳහා සූදානම් වීමක් ලෙස ධවල මන්දිරය සලකන, දකුනු ලෙබනනය තුල ඊස්රායල් ප්‍රහාරයේදී එක්සත් ජනපදය සමීපව මැදිහත් වූ බව නිපුන මාධ්‍යවේදියෙක් වන සේමෝර් හර්ෂ් මෑත දී නිව්යෝකර් පත්‍රයට ලියූ ලිපියකදී විස්තර කලේ ය.

ඉරානයට විරුද්ධව මිලිටරි ප්‍රහාරයක් සඳහා සුදුසු අවස්ථාවක් එක්සත් ජනපදය විසින් සොයමින් සිටින බව මැනවින් දන්නා සෙසු ප්‍රධාන බලයන් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුලදී එක්සත් ජනපද ආස්ථානයට සහයෝගය දී ඇත්තේ අකමැත්තෙනි. මේ අවුරුද්ද මුල දී බ්‍රිතාන්‍යය, ප්‍රන්සය සහ ජර්මනිය සම්බාධක සඳහා එක්සත් ජනපද ඉල්ලීම සමග පෙල ගැසුනේ ටෙහෙරානයට විරුද්ධව ගනු ලබන කවර හෝ පියවරයන් තුලදී ස්වකීය හඬ පවත්වාගෙන යාම මගින් මැද පෙරදිග තුල ඔවුන්ගේ උත්සුකතාවයන් ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් බවට සැකයක් නැත. රුසියාව සහ චීනය ඉරානයට විරුද්ධව දඬුවම් පැමිනවීමේ කවර හෝ ක්‍රියාවකට විරුද්ධත්වය ප්‍රකාශ කල අතර ස්වයංක්‍රීය සම්බාධක පැනවීම ඉවත් කර එක්සත් ජාතීන්ගේ යෝජනාව යලි සැකසූ විටදී පමනක් සහයෝගය දුන්හ. 1979 දී ෂා රේෂා පාලවි බලයෙන් පහකිරීමෙන් පසුව ටෙහෙරානයත් සමග කිසිදු ආරක්ෂක සම්බන්ධතාවයක් නො පැවති එක්සත් ජනපදය මෙන් නොව, සෙසු සියලු ම ප්‍රධාන බලයන්ට ඉරානය තුල ආරක්ෂක උත්සුකතා ඇත.

අඟහරුවාදා ඉරාන නිවේදනයෙන් පසුව මෙම බෙදීම් නැවත ඉස්මතු විය. ඉරාන යෝජනා සහ ඒ සම්බන්ධ ඔවුන්ගේ ප්‍රතිචාරය සාකච්ඡා කිරීම සඳහා එක්සත් ජනපද නිලධාරීන් ඔවුන්ගේ යුරෝපීය සම පාර්ශවකරුවන් බදාදා නිව් යෝර්ක් නගරයේ දී නො නිල වශයෙන් හමු වීමට නියමිතව තිබුනි. සාකච්ඡාවට සහභාගි නොවූ චීනය සහ රුසියාව යන දෙක ම ටෙහෙරානය සමග තව දුරටත් සාකච්ඡාවලට එලඹෙන ලෙස ඉල්ලා තිබේ. අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු නො කල හොත් "යලි කෙදිනකවත් අවස්ථාවක් නො ලැබෙනු ඇත" යි ප්‍රන්ස විදේශ ඇමති පිලිපේ දෝස්ටේ-බ්ලසී ප්‍රකාශ කල නමුදු චීන විදේශ ඇමති ප්‍රකාශයක් නිකුත් කරමින් "රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා හරහා සාමකාමී විසඳුමක්" සඳහා කැඳවුම් කලේ ය.

ටෙහෙරානයට විරුද්ධව ප්‍රකෝපකාරී සම්බාධක පැනවීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මන්ඩලය මත පීඩනය යෙදීමේ සහ ඉරානයට හා සිරියාවට එරෙහිව මිලිටරි ප්‍රහාරයන් සූදානම් කරන අතර ම ඉරාන පාලන තන්ත්‍රයට යටි වල කැපීම සහ එය අස්ථාවර කිරීම සඳහා ඉරානයේ විරුද්ධ කන්ඩායම්වලට අරමුදල් සැපයීම ඉහල දැමීමේ ඉරානය සම්බන්ධයෙන් බුෂ් පරිපාලනයේ දෘඩතර ආස්ථානය නො වෙනස්ව පවතී. ඉරානයට දිරිදීමනා සම්පාදනය කිරීමේ ඒකාබද්ධ ජාත්‍යන්තර පැකේජයට නාමිකව සහයෝගය දෙන අතර දී පවා හොඳ ම ක්‍රමය ඉරානයට පහර දීම ලෙස පෙන්ටගනය තුල නිරන්තරව සාකච්ඡා කෙරුනි.

පසු ගිය මාසයේ "අවසන් ආස්ථානය" මාතෘකාව යටතේ නිව් යෝර්කර් පත්‍රයට ලියූ ලිපියක දී ඉරානයේ න්‍යෂ්ටික පහසුකම්වලට, නගරවලට සහ යටිතල පහසුකම්වලට දැවැන්ත ප්‍රහාරයක ප්‍රතිඵල පිලිබඳව ධවල මන්දිරය සහ පෙන්ටගනය විවාදයක යෙදුන බව සේමෝර් හර්ෂ් යලි වතාවක් විස්තර කලේ ය. බුෂ්ගේ ප්‍රසිද්ධ අනතුරු ඇඟවීම්වලින් මුලුමනින් ම වෙන්ව හර්ෂ් මෙසේ සටහන් කලේ යඃ "එහි නිහඬ අනතුරක් තිබුනිඃ ජනාධිපතිගේ නියෝගය යටතේ ගුවන් හමුදාවේ පිටුබලය ලබන එක්සත් ජනපද මූලෝපායාත්මක අධිකාරිය ඉරානය තුල දැවැන්ත බෝම්බ ප්‍රහාරයන් සඳහා සැලසුම් ඇඳ තිබේ."

දකුනු ලෙබනනයේදී හෙස්බුල්ලා සංවිධානයට විරුද්ධව ක්ෂනික ජයග්‍රහනයක් අත්කර ගැනීමට ඊස්රායලයේ නින්දා සහගත අසමත් වීම ටෙල් අවිව්වලට පමනක් නොව, වොෂින්ටනයට ද පරාජයක් බව නිසැක ය. දැවැන්ත සහ අනුකම්පා විරහිත බලය පාවිච්චි කිරීම තිබියදී ම ඊස්රායල් ප්‍රහාරය හෙස්බුල්ලා සංවිධානයේ ප්‍රතිප්‍රහාර එල්ල කිරීමේ හැකියාව විනාශ කිරීමට අසමත් වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ලෙබනනය සහ කලාපය පුරාම හෙස්බුල්ලා සංවිධානයේ සහ ඉරානයේ කීර්තිය ඉහල නැගුනි. ඉරාකය සහ ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපද මිලිටරිය මුහුන දෙන ගැඹුරු වන විනාශයන් මෙන්ම ඉරානයට විරුද්ධව කරන කවර හෝ යුද්ධයක් තෙල් මිල සහ ලෝක ආර්ථිකය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම සම්බන්ධ කනස්සල්ල විසින් මැද පෙරදිග එක්සත් ජනපද ස්ථානය ද දුර්වල කරනු ලැබ ඇත.

විභව අන්තරායන් ගැන එක්සත් ජනපදය තුල පවතින කනස්සල්ල හර්ෂ් පෙන්නුම් කලේ යඃ " ක්‍රියාන්විත රාජකාරියෙහි යෙදී සිටින සහ විශ්‍රාමික නිලධාරීන්ට අනුව පෙන්ටගනය තුල ජ්‍යෙෂ්ට අනදෙන නිලධාරීන් ජනාධිපතිගේ (මිලිටරි) සැලසුම්වලට අභියෝග කර තිබේ. ඉරාන න්‍යෂ්ටික ව්‍යාපෘතීන් විනාශ කිරීමේ බෝම්බ ප්‍රහාර සාර්ථක නො වීමට ඉඩ ඇතැයි ජෙනරාල්වරු සහ අද්මිරාල්වරු පරිපාලනයට කියා ඇත. ප්‍රහාරයන් මැද පෙරදිග සම්බන්ධයෙන් බරපතල ආර්ථික, දේශපාලන සහ මිලිටරි ප්‍රතිවිපාක ඇති කරනු ඇතැයි ද ඔවුහු අනතුරු අඟවා තිබේ."

කෙසේ නමුත් අසල්වැසි ඉරාකය තුල කලාක් මෙන් නො ඉවසිලිවන්ත සහ සාපරාධී මිලිටරි ක්‍රියාවලට ධවල මන්දිරය නො පෙලඹෙනු ඇතැයි නිගමනය කිරීම වැරදි ය. වඩාත් ආක්‍රමනශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරන බුෂ් පරිපාලනයේ කොටස්වල චින්තනය දක්ෂිනාංශික ඇමරිකානු ව්‍යාපාරික ආයතනයේ මයිකල් ලෙඩීන් විසින් සංක්ෂිප්තව සටහන් කලේ ය. අගෝස්තු 14 ලියූ ලිපියක දී ඉරාකය සහ ලෙබනනය ආක්‍රමනය කිරීම "මූලෝපායාත්මක දෘෂ්ටියේ අසාර්ථකත්වයක් ලෙස" කෙරෙන විවේචනවලට පරිහව කල ඔහු ඉරානයට සහ සිරියාවට එරෙහිව පලල් කලාපීය උද්ඝෝෂනයක් ඉල්ලා සිටින බව ප්‍රකාශ කලේ ය.

"අපට ඉරාකය සහ ඇෆ්ගනිස්ථානය තුල පමනක් සටන් කර යහපත් ආරක්ෂාවක් සම්පාදනය කල නො හැක්කක් සේ ම ලෙබනනය තුල පමනක් සටන් කර ඊස්රායලයට හෙස්බුල්ලා සංවිධානය විනාශ කල නො හැකි ය. හෙස්බුල්ලා සංවිධානය විනාශ කිරීම සඳහා ඩැමස්කස් පාලන තන්ත්‍රයේ වෙනසක් ඉල්ලා සිටියි. ඉරාකයේ සහ ඇෆ්ගනිස්ථානයේ ආරක්ෂාව ඩැමස්කස් සහ ටෙහෙරාන් තුල පාලන තන්ත්‍ර වෙනසක් ඉල්ලා සිටියි. කලාපීය යුද්ධයක දී ඒවා සටන් බිම්" යයි ඔහු ප්‍රකාශ කලේ ය.

"පූර්ව භංග යුද්ධය" පිලිබඳ එක්සත් ජනපද දේශනාව තුල ආවේනිකව පවතින නො නවතින මිලිටරි ආක්‍රමනයේ තර්කනය සහ සමස්ථ මැද පෙරදිග ම ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහා සැලසුම් ලේඩීන්ගේ මෙම ප්‍රකාශයන් තුල ප්‍රස්ථාර ගත කර තිබේ.

© www.wsws.org